## මුදල් කොමිෂන් සභාව

**(ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 'ඡ' ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලදී)**

## நிதி ஆணைக்குழு

**(அரசியலமைப்பின் 154'எ ஆம் உறுப்புரையின் கீழ் தாபிக்கப்பட்டது)**

# Finance Commission

**(Established under Article 154 R of the Constitution)**

## වසර 2012 සඳහා වූ මුදල් කොමිෂන් සභාවේ

## වාර්ෂික කාර්යසාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම්

**2012 ஆம் ஆண்டுக்கான வருடாந்த செயலாற்றுகை அறிக்கையும**
**வருடாந்த கணக்கீடும்**

# Annual Performance Report and the Statement of Accounts of the Finance Commission for 2012

පටුන


**1. හැඳින්වීම** .......... 2

1.1 මුදල් කොමිෂන් සභාව ස්ථාපිත කිරීම .......... 2

1.2 මුදල් කොමිෂන් සභාවේ බලතල .......... 2

1.3 මුදල් කොමිෂන් සභාවේ මූලික කාර්යයන් .......... 3

**2. මුදල් කොමිෂන් සභාවේ උපායමාර්ගික යොමු වීම** .......... 3

2.1 දැක්ම .......... 3

2.2 මෙහෙවර .......... 3

2.3 ප්‍රමුඛ පරාසයන් .......... 3

**3. ආයතනික ව්‍යුහය සහ කාර්යමණ්ඩල තොරතුරු** .......... 4

3.1 මුදල් කොමිෂන් සභාවේ ව්‍යුහය .......... 4

3.2 මුදල් කොමිෂන් සභා ලේකම් කාර්යාලය .......... 4

3.3 2012.12.31 දිනට කාර්යමණ්ඩලය .......... 4

3.4 කාර්යමණ්ඩල සටහන .......... 6

**4. මුදල් කොමිෂන් සභාවේ කාර්යසාධනය - 2012** .......... 7

4.1 ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය .......... 7

4.2 ප්‍රතිඵල පාදක සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ අංශය .......... 8

4.3 අයවැය හා පුරෝකථන අංශය .......... 10

4.4 අධීක්ෂණ හා ඇගයීම් අංශය .......... 11

4.5 පරිපාලන අංශය .......... 11

4.6 මූල්‍ය අංශය .......... 14

**5. පොදු පරිපාලනය** .......... 16

5.1 2012 වර්ෂයේ කාර්යමණ්ඩලය .......... 16

5.2 මුදල් කොමිෂන් සභාවට මාරු කරන ලද නිලධාරීන් - 2012 .......... 17

5.3 මුදල් කොමිෂන් සභාවෙන් මාරු කරන ලද නිලධාරීන් - 2012 .......... 17

5.4 මුදල් කොමිෂන් සභාවට කරන ලද නව පත්වීම් - 2012 .......... 17

**6. මධ්‍යකාලීනව කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා යෝජිත උපායමාර්ග** .......... 17

**7. විගණන වාර්තාව** .......... 18

## 2012 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාවේ කාර්යසාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම්

## 1. හැඳින්වීම

### 1.1 මුදල් කොමිෂන් සභාව ස්ථාපිත කිරීම

1987 වර්ෂයේ දී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකරන ලද 13 වන සංශෝධනය මගින් පළාත් සභා සහ මුදල් කොමිෂන් සභාව පිහිටුවීමට අවශ්‍ය විධිවිධාන සලස්වන ලදී. පළාත් සභාව විසින් පවරන ලද බලතල ක්‍රියාත්මක කිරීමේ දී, පළාත්වලට සම්පත් බෙදා හැරීම හා පළාත් සැලසුම්කරණ ක්‍රියාවලිය පහසුකරලීම පිණිස මුදල් කොමිෂන් සභාව ස්ථාපිත කෙරිණි.

13 වන ව්‍යවස්ථා සංශෝධනය තුළ මුදල් කොමිෂන් සභාවට පැවරෙන මූලික වගකීම් පැහැදිලිව දක්වා ඇත. ඒවා අතර, පළාත්වලට අරමුදල් බෙදා වෙන් කිරීමට අදාල මූලධර්මයන් පිළිබඳව රජයට නිර්දේශ කිරීම හා රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති වන අයුරින් පළාත් නවය අතර සම්පත් වෙන් කරලීම ප්‍රධාන වේ.

### 1.2 මුදල් කොමිෂන් සභාවේ බලතල

මුදල් කොමිෂන් සභාවේ බලතල පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ජ (4) (5) හා (6) යන වගන්තිවල පැහැදිලිව සඳහන් කර ඇත.

(i) පළාත් අවශ්‍යතා සපුරා ගැනීමේ අරමුණ ඉටුකරලීමෙහිලා ප්‍රමාණවත් වන පරිදි, මුදල් කොමිෂන් සභාවේ නිර්දේශය හා උපදෙස් මත පදනම්ව රජය විසින් වාර්ෂික අයවැයෙන් පළාත් සඳහා අරමුදල් සැපයිය යුතු වේ.

(ii) පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් මුදල් කොමිෂන් සභාව විසින් අතිගරු ජනාධිපතිතුමා වෙත නිර්දේශ ඉදිරිපත් කළ යුතු වේ.

(අ) රජය මගින් වාර්ෂිකව පළාත් වෙත සපයනු ලබන අරමුදල් හා ඒවා පළාත් අතර බෙදා වෙන් කිරීමට අදාල වූ ප්‍රතිපත්ති.

(ආ) පළාත් මූල්‍යකරණය පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා විසින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන වෙනත් ඕනෑම කරුණක්.

(ඇ) රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් සහතික කරලීමේ අරමුණ ඇතිව මුදල් කොමිෂන් සභාව විසින් ප්‍රතිපත්ති සම්පාදනය සිදු කළ යුතු වේ. එහිදී එක් එක් පළාතට අයත් ජනගහනය, එක් එක් පළාතේ ඒක පුද්ගල ආදායම, සමාජ-ආර්ථික විෂමතාවයන් වඩ වඩාත් අවම කරලීමේ අවශ්‍යතාවය සහ එක් එක් පළාතේ ඒක පුද්ගල ආදායම සම්බන්ධයෙන් පවත්නා වෙනස වඩාත් අවම කරලීමේ අවශ්‍යතාවය යන කරුණු සැලකිල්ලට ගත යුතු වේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ජ (7) වගන්තියේ දැක්වෙන පරිදි මුදල් කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබන සෑම නිර්දේශයක්ම අතිගරු ජනාධිපතිතුමා විසින් පාර්ලිමේන්තුව හමුවේ තැබිය යුතු අතර, ඒ පිළිබඳව ගනු ලබන ක්‍රියාමාර්ග ද පාර්ලිමේන්තුවට දැනුම් දිය යුතු වේ.

**1.3 මුදල් කොමිෂන් සභාවේ මූලික කාර්යයන්**

(අ) පළාත් අවශ්‍යතාවයන් තක්සේරු කිරීම.

(ආ) වාර්ෂිකව ලබා දෙන අරමුදල් පළාත් අතර බෙදා වෙන් කිරීම.

(ඇ) එක් එක් පළාත සඳහා වෙන් කරන ලද සමස්ත අරමුදල් ප්‍රමාණය පුනරාවර්තන හා මූලධන වියදම් අවශ්‍යතා සඳහා වෙන් කර දීම.

(ඉ) ප්‍රාග්ධන අරමුදල් "පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන" සහ "උපමාන පාදක ප්‍රදාන" අතර බෙදා වෙන් කිරීම.

(ඊ) හඳුනාගත් සංවර්ධන අංශ/ආයතන අතර පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන බෙදා හැරීම.

(උ) පළාත් මූල්‍ය සම්පත් මැනවින් උපයෝජනය කිරීම මගින් තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති කර ගැනීමට හැකිවන පරිදි මූලධර්ම හා මාර්ගෝපදේශ සැකසීම.

## 2. මුදල් කොමිෂන් සභාවේ උපායමාර්ගික යොමු වීම

**2.1 දැක්ම**

සියලුම පළාත්වල තුලිත හා සාධාරණ සමාජ-ආර්ථික සංවර්ධනයක්.

**2.2 මෙහෙවර**

පළාත් විෂයයෙහි තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කර ගැනීමේ අරමුණින් ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ සැකසීම, සැලසුම්කරණය හා ඊට අවශ්‍ය සහයෝගීතාවය සැපයීම, සම්පත් බෙදා වෙන් කිරීම, සංවර්ධන කාර්යයන් මෙහෙයවීම හා ඇගයීම සහ පළාත් අතර හා පළාත් තුළ පවත්නා විෂමතාවයන් සාධාරණ අයුරින් අඩුකරලීම සඳහා උචිත නිර්දේශ රජයට සැපයීම.

**2.3 ප්‍රමුඛ පරාසයන්**

- පළාත් අතර මූල්‍ය සම්පත් වෙන් කිරීමට අදාල මූලධර්ම සැකසීම හා ඒ පිළිබඳව දැනුවත් කිරීම.
- පළාත් අතර සම්පත් සාධාරණ අයුරින් බෙදී යෑම සහතික කරලීම.
- ප්‍රාදේශීය විෂමතා අඩු කරලීම හා මානව සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම.
- පළාත් තුළ සම්පත් කාර්යක්ෂම ලෙස උපයෝජනයට ගැනීම සහතික කරලීම.
- පළාත් හා ප්‍රාදේශීය මට්ටමෙන් ආදායම් උත්පාදනය පුළුල් කිරීම.
- පළාත් හා ප්‍රාදේශීය මට්ටමේ ආයතනික සංවර්ධනය ශක්තිමත් කිරීම.

- රජය හා පළාත් අතර කාර්යක්ෂම වූ සම්බන්ධීකරණයක් ඇති කරලීම.
- රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය මගින් ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය.
- මුදල් කොමිෂන් සභාවේ මානව හා ආයතනික ධාරිතාව වැඩිදියුණු කිරීම.

## 3. ආයතනික ව්‍යුහය සහ කාර්යමණ්ඩල තොරතුරු

### 3.1 මුදල් කොමිෂන් සභාවේ ව්‍යුහය

මුදල් කොමිෂන් සභාව සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විත වන අතර, එයින් දෙදෙනෙකු නිල බලයෙන් පත්වේ. එනම්, මහ බැංකුවේ අධිපති සහ මහා භාණ්ඩාගාරයේ ලේකම්ය. අනෙක් සාමාජිකයින් තිදෙනා පත් කෙරෙනුයේ ප්‍රධාන ජනවර්ග තුන නියෝජනය වන පරිදිය. 2012 වර්ෂය තුළ මුදල් කොමිෂන් සභාවේ සාමාජිකයින් වූයේ ආරියරත්න හේවගේ මහතා (සභාපති), එම්.එන්.ජුනයිඩ් මහතා, සී.පී.ර්.ගුණසිංහම් මහතා, ආචාර්ය පී.බී.ජයසුන්දර මහතා (නිල බලයෙන් සාමාජික) හා අජිත් නිවාඩ් කබ්රාල් මහතා (නිල බලයෙන් සාමාජික) යන මහත්වරුන්ය.

### 3.2 මුදල් කොමිෂන් සභා ලේකම් කාර්යාලය


මුදල් කොමිෂන් සභා ලේකම් කාර්යාලය “ඒ” ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් ලෙස ක්‍රියාත්මක වේ. ප්‍රධාන විධායක නිලධාරිවරයෙකු (ලේකම්) යටතේ මෙම ලේකම් කාර්යාලය පාලනය වන අතර, ඔහුගේ සහායට නිලධාරි මණ්ඩලයක් සිටී. ඒ තුළට අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, අභ්‍යන්තර විගණන නිලධාරි, සහකාර අධ්‍යක්ෂවරුන්, පරිපාලන නිලධාරි, සහකාර පර්යේෂණ නිලධාරීන්, වැඩසටහන් සහකාරවරුන්, කළමනාකරණ සහායකයින් සහ සුළු සේවක පිරිස් අයත් වේ.

### 3.3 2012.12.31 දිනට කාර්යමණ්ඩලය

| තනතුර | සේවාව | වැටුප් කේතය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|
| | | | | ස්ථිර | අනියම් | කොන්ත්‍රාත් පදනම |
| ලේකම් | | SL3 | 01 | 01 | | |
| අධ්‍යක්ෂ | ශ්‍රී.ල.ප.සේ./ශ්‍රී.ල.ක්‍ර.සේ./ ශ්‍රී ල.ග.සේ. | SL1 | 04 | 03 | | |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | ශ්‍රී.ල.ප.සේ./ශ්‍රී.ල.ක්‍ර.සේ./ ශ්‍රී ල.ග.සේ. | SL1 | 04 | 03 | | |
| අභ්‍යන්තර විගණන නිලධාරි | ශ්‍රී ල.ග.සේ. II | SL1 | 01 | - | | |
| සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී.ල.ප.සේ./ශ්‍රී.ල.ක්‍ර.සේ./ ශ්‍රී ල.ග.සේ. | SL1 | 05 | 03 | | |
| **ජ්‍යෙෂ්ඨ මට්ටම එකතුව** | | | **15** | **10** | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| පරිපාලන නිලධාරි | රා.ක.ස. (අධිශ්‍රේණිය) | MN7 | 01 | - | | |
| සංඛ්‍යාලේඛන නිලධාරි | | MN5 | 01 | 01 | | |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ II පන්තියේ II ශ්‍රේණිය | MT | 01 | - | | |
| **තෘතීය මට්ටම එකතුව** | | | **03** | **01** | | |
| අයවැය සහකාර | ආශ්‍රිත නිලධාරි | MN4 | 02 | - | | |
| පර්යේෂණ සහකාර | ආශ්‍රිත නිලධාරි | MN4 | 08 | 07 | | |
| සහකාර පර්යේෂණ නිලධාරි | දෙපාර්තමේන්තුගත | MN4 | 12 | 12 | | |
| වැඩසටහන් සහකාර | දෙපාර්තමේන්තුගත | MN4 | 10 | 04 | | |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.ක.ස. | MN2 | 13 | 07 | | |
| පරිගණක දත්ත ක්‍රියාකරු | දෙපාර්තමේන්තුගත | MN1 | 01 | - | | |
| **ද්විතියික මට්ටම එකතුව** | | | **46** | **30** | | |
| රියදුරු | රියදුරු සේවය | PL3 | 08 | - | 04 | |
| කා.සේ.සේ. | කා.සේ.සේ. | PL1 | 05 | 02 | 02 | 01 |
| **ප්‍රාථමික මට්ටම එකතුව** | | | **13** | **02** | **06** | **01** |

### 3.4 කාර්යමණ්ඩල සටහන



## 4. මුදල් කොමිෂන් සභාවේ කාර්යසාධනය - 2012

මුදල් කොමිෂන් සභාවට පැවරී ඇති මූලික කාර්යය වනුයේ රට තුළ තුලිත සංවර්ධනයක් සහතික වන පරිදි පළාත් අතර අරමුදල් වෙන් කිරීම හා ඒවා ඵලදායී ලෙස භාවිතයට ගැනීම තහවුරු කරනු පිණිස අවශ්‍ය මාර්ගෝපදේශ සැපයීම හා තාක්ෂණික සහය ලබා දීමයි. මෙහිලා අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සිදු කරනු ලබන්නේ සභාපතිගේ මූලිකත්වයෙන් යුත් කොමිෂම විසින් වේ. 2012 වර්ෂය තුළදී කොමිෂම තුන් වරක් රැස් වී ඇත.

මුදල් කොමිෂන් සභාව අංශ හයකින් සමන්විත වේ. එනම්,

1. ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය
2. ප්‍රතිඵල පාදක සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ අංශය
3. අයවැය හා පුරෝකථන අංශය
4. අධීක්ෂණ හා ඇගයීම් අංශය
5. පරිපාලන අංශය
6. මූල්‍ය අංශය

මුදල් කොමිෂන් සභාවට ව්‍යවස්ථාවෙන් පැවරී ඇති වගකීම්වලට අදාල කාර්යයන් ඉටු කිරීම, ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය, ප්‍රතිඵල පාදක සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ අංශය, අයවැය හා පුරෝකථන අංශය හා අධීක්ෂණ හා ඇගයීම් අංශය මගින් සිදු කරනු ලබන අතර, පරිපාලන හා මූල්‍ය අංශයන් විසින් අවශ්‍ය සහාය සේවාවන් සිදු කරනු ලබයි.

### 4.1 ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය

2013 වර්ෂය වෙනුවෙන් පළාත් වෙත ලබා දීමට නිර්දේශිත ප්‍රතිපාදන හා එම ප්‍රතිපාදන පළාත් අතර බෙදා හරිනු ලබන ආකාරය හා එයට අදාල ප්‍රතිපත්ති අන්තර්ගත නිර්දේශය 2012 වර්ෂයේදී පිළියෙල කරන ලදී. එය අතිගරු ජනාධිපතිතුමා මගින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

2012 වර්ෂයේදී මුදල් කොමිෂන් සභාව විසින් පළාත් වෙත නිකුත් කරන ලද "මූල්‍ය අවශ්‍යතා ඉල්ලුම් කිරීමේ මාර්ගෝපදේශ" අනුව පළාත් අධිකාරීන් විසින් 2013 වර්ෂය සඳහා වූ ප්‍රාග්ධන මූල්‍ය අවශ්‍යතා ඉල්ලීම් මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී. මෙම ඉල්ලීම් අධ්‍යයනය කිරීමෙන් අනතුරුව තක්සේරු කරන ලද ප්‍රාග්ධන වියදම් අවශ්‍යතාවය මහා භාණ්ඩාගාරය වෙත නිර්දේශ කරන ලදී. මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ පදනම් කරගෙන මහා භාණ්ඩාගාරය විසින් 2013 වර්ෂය සඳහා පළාත් සභාවලට වෙන් කරනු ලැබූ ප්‍රාග්ධන ප්‍රතිපාදන පළාත් අතර බෙදා වෙන් කිරීම 2012 ඔක්තෝබර් මාසය වන විට සිදු කරන ලදී. පළාත් අතර ප්‍රාග්ධන අරමුදල් වෙන් කිරීමේදී සංඛ්‍යානමය සූත්‍රයක් භාවිත කරන

ලද අතර, එහිදී ජනතාවගේ සමාජ-ආර්ථික තත්වයට සමීප ලෙස බලපාන විචල්‍යයන් කිහිපයක් සැලකිල්ලට ගෙන ඇත. ඒවා අතර පළාත් ඒක පුද්ගල ආදායම, දරිද්‍රතා අනුපාතය, විරැකියා අනුපාතය, ළමා හා මාතෘ මරණ අනුපාතය, පාසල්වලට ඇතුළත් වීමේ අනුපාතය, පාසල් සිසුන්ගේ ඉගෙනුම් සාධනය, නිවාසවල ගුණාත්මකභාවය සහ පළාත් මාර්ග පද්ධතිය වැනි දෑ ප්‍රධාන වේ. ඒ අනුව, 2013 වර්ෂය සඳහා එක් එක් පළාතට ලබා දුන් ප්‍රාග්ධන අරමුදල් පහත දැක්වේ.

*රු.මි.*

| පළාත | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | සංවර්ධන ව්‍යාපෘති | උපමාන පාදක ප්‍රදාන |
|---|---|---|---|
| බස්නාහිර | 1,266 | 435 | 370 |
| මධ්‍යම | 1,229 | 2,025 | 321 |
| දකුණ | 1,229 | 405 | 295 |
| උතුරු | 1,030 | 2,663 | 195 |
| නැගෙනහිර | 1,000 | 3,915 | 217 |
| වයඹ | 1,137 | 730 | 270 |
| උතුරු මැද | 1,000 | 1,140 | 230 |
| ඌව | 1,144 | 1,452 | 240 |
| සබරගමුව | 1,145 | 1,620 | 252 |
| **එකතුව** | **10,180** | **14,384** | **2,390** |

මෙසේ වෙන් කළ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන එක් එක් විෂයයන්/ අංශ අතර බෙදා වෙන් කිරීම සඳහා අතීත කාර්යසාධනය, ආයතනික ධාරිතාවය, විදේශාධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති, රජයේ සංවර්ධන ප්‍රමුඛතා සහ පවත්නා සම්පත් ප්‍රමාණය වැනි කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලදී. ඒ අනුව, 2013 වර්ෂය සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන එක් එක් විෂයයන්/ අංශ අතර බෙදා වෙන් කරන ලද ආකාරය ඇමුණුම 1 හි දැක්වේ.

2013 වර්ෂයේදී පළාත්වලට වෙන් කරනු ලැබූ ප්‍රතිපාදන ඵලදායී ලෙස මහජන සුභසිද්ධිය උදෙසා ආයෝජනය කිරීමට මගපෙන්වීමක් ලබා දීම පිණිස මාර්ගෝපදේශ සංග්‍රහයක් 2012 ඔක්තෝබර්වලදී සකස් කර පළාත් සභාවලට යවන ලදී. 2013 වර්ෂයේ සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී එම මාර්ගෝපදේශ අනුගමනය කිරීම අපේක්ෂා කෙරේ.

### 4.2 ප්‍රතිඵල පාදක සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ අංශය

මුදල් කොමිෂන් සභාව විසින් 2011 වර්ෂයේ සිට පළාත් විසින් අනුගමනය කරනු ලබන ප්‍රායෝගික සැලසුම් ක්‍රමවේදයක් ලෙස "ප්‍රතිඵල පාදක කළමනාකරණ ප්‍රවේශය" හඳුන්වා දෙන ලදී. ආංශික පදනමින් මෙම ප්‍රවේශය භාවිතයට ගැනීමේදී පළාත් අධිකාරීන් යම් යම් දුෂ්කරතාවලට මුහුණ දුන් බව නිරීක්ෂණය විය. මෙම තත්ත්වය තේරුම් ගැනීමෙන් අනතුරුව ප්‍රතිඵල පාදක කළමනාකරණ ප්‍රවේශයෙහි වැඩිදියුණු කරන ලද අනුවාදයක් වන "ආයතනික ප්‍රතිඵල රාමුව" වෙත විතැන් වීමක් සිදු

විය. මේ පිළිබඳව පළාත් මට්ටමේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දැනුවත් කිරීම පිණිස 2012 වර්ෂය තුළදී මුදල් කොමිෂන් සභාව විසින් ආයතනික ප්‍රතිඵල රාමු ප්‍රවේශය පිළිබඳව පළාත් මට්ටමෙන් වැඩමුළු රාශියක් සංවිධානය කරන ලදී. මෙහිදී, 2013 වර්ෂයේ සිට ස්වකීය මධ්‍යකාලීන සංවර්ධන සැලසුම්, ආයතනික ප්‍රතිඵල රාමු ප්‍රවේශය මත පදනම්ව සකස් කරන ලෙස, කොමිෂන් සභාව විසින් පළාත්වලට උපදෙස් සපයන ලදී.

එසේම මෙම අංශය වෙත පැවරී ඇති පහත දැක්වෙන මූලික කාර්යයන් 2012 වර්ෂය තුළ ඉටු කර ඇත.

1. පළාත්වල 2012 වාර්ෂික සංවර්ධන සැලසුම්වලට මුදල් කොමිෂන් සභාවේ එකඟතාවය ලබා දීම.

2. පළාත්වල 2012 වාර්ෂික සංවර්ධන සැලසුම් තුළ පළාත් අපේක්ෂා කරනු ලබන සංශෝධන සඳහා එකඟතාවය ලබා දීම.
3. මුදල් කොමිෂන් සභාව විසින් ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරනු ලබන 2013 වර්ෂයේ නිර්දේශ සකස් කිරීම සඳහා දායක වීම.

එසේම, පළාත් මට්ටමෙන් වෙන් කරනු ලබන ප්‍රාග්ධන අරමුදල් වඩාත් ඵලදායී ලෙස ආයෝජනය කිරීම තහවුරු කරනු වස් පහත දැක්වෙන ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී.

i. රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුව තුළ විශේෂයෙන් හඳුනාගෙන ඇති ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් සමග සමගාමී අයුරින් පළාත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දීම. මෙමගින් පළාත්බද සංවර්ධනය යන තේමාව යටතේ 2016 වන විට අදාල ඉලක්ක ලඟා කර ගැනීම සඳහා සියළුම පළාත් වගකිව යුතු වනු ඇත.
ii. සියළුම පුද්ගලයින්ට අවම සුභසාධන මට්ටමකට ලඟා විය හැකි වන පරිදි අධ්‍යාපන, සෞඛ්‍ය හා සමාජ සේවා වැනි අංශ යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පළාත් වෙත දැනුම් දීම. මේ තුළින් විවිධ සමාජ-ආර්ථික ස්ථර අතර පවත්නා විෂමතාවයන් කිසියම් දුරකට අඩුකරලීම මගින් සමාජ සාධාරණත්වය තහවුරුකරලීමට හැකි වනු ඇත.
iii. පළාත් විසින් ඉදිරිපත් කරනු ලබන වාර්ෂික අයවැය ඇස්තමේන්තු වඩාත් තාර්කික විය යුතු බව අවධාරණය කරන ලදී. මෙහිදී විශේෂයෙන් බලාපොරොත්තු වනුයේ සීමිත අරමුදල් සම්පාදනය සැලකිල්ලට ගෙන වැඩි ප්‍රමුඛතාවයකින් යුතු ව්‍යාපෘති පමණක් සංවර්ධන සැලසුම් තුළට අන්තර්ගත කිරීමයි. මෙමගින් අවශ්‍යතා තක්සේරුව සහ අරමුදල් සම්පාදනය අතර පවත්නා පරස්පරතා අවම කරලීමට හැකිවනු ඇත.
iv. රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූල වෙමින් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම තුළින් ග්‍රාමීය අංශය තුළ රැකියා හා ආදායම් අවස්ථා පුළුල් කරලීමේ ක්‍රියාමාර්ග කෙරෙහි යොමු වීම. මේ යටතේ ඒ ඒ පළාත්වලට විශේෂිත ආකර්ශණීය ස්ථාන හා පාරම්පරික උරුමයන් පදනම් කරගෙන විශේෂිත

වශයෙන් සංචාරකයන් කේන්ද්‍රකොටගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට උපදෙස් දී ඇති අතර, සේවා සැපයීමේදී පෞද්ගලික අංශය සම්බන්ධ කරගත යුතු වේ.

v. රාජ්‍ය අරමුදල් සීමිත බැවින් විකල්ප අරමුදල් කෙරෙහි යොමු වීමේ වැදගත්කම පෙන්වා දී ඇති අතර, සම්පත් පරතරය පියවීමෙහිලා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග ලෙස රාජ්‍ය-පෞද්ගලික සහයෝගිතාවය ශක්තිමත් කිරීම, වාණිජ පදනමකින් යුත් ව්‍යාපෘති විෂයයෙහි පෞද්ගලික අංශය දිරි ගැන්වීම සහ ඇතැම් පොදු සේවාවන් සඳහා ප්‍රතිලාභී දායකත්වය ලබා ගැනීමට යෝජනා කර ඇත.

### 4.3 අයවැය හා පුරෝකථන අංශය

පළාත්වල පුනරාවර්තන මූල්‍ය අවශ්‍යතාවයන් තක්සේරු කිරීමෙන් අනතුරුව වාර්ෂික අයවැයෙන් අදාල වෙන් කිරීම සිදු කිරීම පිණිස මහා භාණ්ඩාගාරය වෙත එම මූල්‍ය අවශ්‍යතාවයන් නිර්දේශ කිරීම හා පළාත්වල පුනරාවර්තන වියදම් සඳහා ලබා දෙන සාමූහික ප්‍රතිපාදන පළාත් අතර බෙදා වෙන් කිරීම මෙම අංශයේ මූලික කාර්යය වේ.

2012 වර්ෂයේදී මුදල් කොමිෂන් සභාව විසින් පළාත් වෙත නිකුත් කරන ලද "මූල්‍ය අවශ්‍යතා ඉල්ලුම් කිරීමේ මාර්ගෝපදේශ" අනුව පළාත් අධිකාරීන් විසින් 2013 වර්ෂය සඳහා වූ පුනරාවර්තන මූල්‍ය අවශ්‍යතා ඉල්ලීම් මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී. මෙම ඉල්ලීම් තක්සේරු කිරීමෙන් අනතුරුව ඇස්තමේන්තු කරන ලද පුනරාවර්තන මූල්‍ය අවශ්‍යතාවයෙන් මුදල් කොමිෂන් සභාව විසින් පළාත් වෙත ලබා දෙන ආදායම් ඉලක්ක අඩු කිරීමෙන් පසු සැබෑ පුනරාවර්තන වියදම් අවශ්‍යතාවය හෙවත් සාමූහික ප්‍රදාන මහා භාණ්ඩාගාරය වෙත නිර්දේශ කරන ලදී.

මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ පදනම් කරගෙන මහා භාණ්ඩාගාරය විසින් 2013 වර්ෂය වෙනුවෙන් පළාත්වලට වෙන් කරනු ලැබූ සාමූහික ප්‍රදාන පහත පරිදි වේ.

*රු.මි.*

| **පළාත** | **සාමූහික ප්‍රදාන** |
|---|---:|
| බස්නාහිර | 8,501.76 |
| මධ්‍යම | 14,863.83 |
| දකුණු | 12,908.47 |
| උතුරු | 10,075.30 |
| වයඹ | 14,118.11 |
| උතුරු මැද | 7,345.62 |
| ඌව | 10,263.21 |
| සබරගමුව | 13,088.46 |
| නැගෙනහිර | 11,635.26 |
| **එකතුව** | **102,800.00** |

එසේම, 2012 වර්ෂයේ දී මුදල් කොමිෂන් සභාව, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය, වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂම හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව යන ආයතන නියෝජනය කෙරෙන මණ්ඩලයක් මගින් එක් එක් පළාතේ ප්‍රශස්ත කාර්යමණ්ඩල තක්සේරු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලද අතර, වර්ෂය අවසන් වන විට එය නිම කරන ලදී. මෙම කර්තව්‍යයේදී, අනවශ්‍ය බවට වැටහෙන තනතුරු අහෝසි කිරීම හෝ අදාල පුද්ගලයාට පමණක් සීමා වන සේ ඒවා පවත්වා ගෙන යෑම, එක සමාන වගකීම් ඒකාබද්ධ කිරීම, හැකි සෑම විටෙකම පුළුල් පරාසයක රාජකාරි පැවරීම සහ විශේෂ සේවාවන් සඳහා පොදු ඒකක පිහිටුවීම වැනි කරුණු සැලකිල්ලට ගන්නා ලදී. මෙම විමර්ශණ ක්‍රියාවලිය හරහා ප්‍රශස්ත සේවක සංඛ්‍යා හඳුනා ගැනීම තුළින් සියළුම පළාත් තුළ කාර්යක්ෂම හා ඵලදායී මානව සම්පත් කළමනාකරණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම පිණිස 2013.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රශස්ත කාර්යමණ්ඩල වාර්තාව පළාත් වෙත ලබා දෙන ලදී.

### 4.4 අධීක්ෂණ හා ඇගයීම් අංශය

පළාත් සංවර්ධන සැලසුම් අධීක්ෂණය කිරීමේදී හා ඇගයීමේදී නිසි හා සමාන ආකාරයේ ක්‍රමවේදයක් නොමැති බව මුදල් කොමිෂන් සභාවට අවබෝධ විය. මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන 2012 වර්ෂයේ දී මුදල් කොමිෂන් සභාව විසින් 2013 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීම පිණිස ආයතනික ප්‍රතිඵල රාමු ප්‍රවේශය පදනම් කොටගෙන "ප්‍රතිඵල පාදක අධීක්ෂණ සහ ඇගයුම් ක්‍රමවේදයක්" පළාත් වෙත හඳුන්වාදෙන ලදී. ආයතනික ප්‍රතිඵල රාමු ප්‍රවේශය පළාත්වලට හඳුන්වා දීම සඳහා පළාත් මට්ටමෙන් සංවිධානය කරනු ලැබූ වැඩමුළුවලට සමගාමීව, ප්‍රතිපත්තිමය මට්ටමේ හා ක්‍රියාත්මක මට්ටමේ අධීක්ෂණ සිදු කිරීම සඳහා පළාත් නිලධාරීන්හට අවශ්‍ය උපදෙස් ලබා දීමට කටයුතු කරන ලදී.

තවද, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනයේ (ICTA) සහාය ලබා ගෙන මුදල් කොමිෂන් සභාවේ ත්‍රෛ- භාෂා වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම පිණිස කටයුතු කරන ලදී.

### 4.5 පරිපාලන අංශය

#### *(අ) පෞද්ගලික ලිපිගොනු හා අනෙකුත් ලිපි ලේඛන ක්‍රමානුකූලව පවත්වාගෙන යෑම ඇතුළුව පිරිස් කළමනාකරණය*

අදාල වාර්ෂික වැටුප් වර්ධක සඳහා අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ගෙවීම් සිදු කරන ලදී. නිලධාරීන් විසින් සිදු කරන ලද ඉල්ලීම් සැලකිල්ලට ගෙන සේවා සහතික නිකුත් කරන ලදී. පහත දැක්වෙන තනතුරු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන එම තනතුරු අලුතින් ඇති කිරීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබීය. මෙමගින් අපේක්ෂා කරනු ලැබුවේ මුදල් කොමිෂන් සභාවේ කාර්යයන් විධිමත් පරිදි සිදු කිරීමයි.

| තනතුර | අනුමැතිය |
|---|---|
| • වැඩසටහන් නිලධාරි තනතුරු 05 | අංක DMS/C/05/114 හා 2012.04.03 දිනැති ලිපිය |
| • කා.සේ.සේ. තනතුරු 01 | අංක DMS/C/05/114 හා 2012.04.03 දිනැති ලිපිය |
| • තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි තනතුරු 01 | අංක DMS/C/08/114 හා 2012.10.03 දිනැති ලිපිය. |

*(ආ) බිල්පත් නිරවුල් කිරීම*

මුදල් කොමිෂන් සභාවේ ගෙවීම්වලට අදාල වවුචර් සකස් කර ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ගෙවීම් කටයුතු සඳහා ගිණුම් අංශයට ඉදිරිපත් කරන ලදී. ගිණුම් අංශයෙන් චෙක්පත් සැකසීම අවසන් කළ පසු අදාල ආයතන හා පුද්ගලයින්ට එකී චෙක්පත් නියමිත දිනට යැවීමට කටයුතු කරන ලදී. මෙම සියලු ගෙවීම්වලට අදාල ලිපි ලේඛන මැනවින් පවත්වාගෙන ගොස් ඇත.

*(ඇ) ආරක්ෂක හා සනීපාරක්ෂක සේවාවන් අධීක්ෂණය කිරීම*

සේවා ගිවිසුම් ප්‍රකාරව සේවාවන් පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව මාසිකව බිල්පත් පරීක්ෂා කර, වවුචර් සකසා, නිර්දේශ කර අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමෙන් පසුව ගෙවීම් කටයුතු සඳහා ගිණුම් අංශයට ඉදිරිපත් කරන ලදී.

*(ඇ) කාර්යාල පරිශ්‍රය හා අනෙකුත් වත්කම් නිසි අයුරින් පවත්වාගෙන යාම*

කාර්යාල ගොඩනැගිල්ල මාසිකව කුලී ගෙවීමේ පදනම මත ලබාගෙන ඇති අතර, නඩත්තු කටයුතු කාර්යාලය මගින් ද අනෙකුත් නඩත්තු සහ අලුත්වැඩියා කටයුතු ගොඩනැගිල්ලෙහි හිමිකරු මගින් ද සිදු කරන ලදී. එමෙන්ම, වාහන, පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර හා ෆැක්ස් යන්ත්‍ර ආදී වත්කම්වල නඩත්තු හා අලුත්වැඩියා කටයුතු සේවා ගිවිසුම් ප්‍රකාරව සිදු කරන ලදී.

*(ඉ) නිවාඩු, ණය හා වැටුප් වර්ධක වැනි විෂයයනට අදාල දෛනික පරිපාලන කටයුතු*

නිවාඩු ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් වූ විගස ඒවා නිවාඩු ලේඛනයේ සටහන් කරන ලද අතර, මාසිකව ඇඟිලි සලකුණු යන්ත්‍රයෙන් වාර්තා ලබාගෙන ඒ අනුව නිවාඩු ලේඛනය යථාවත් කරන ලදී. රාජකාරි නිවාඩු, කෙටි නිවාඩු හා රාජකාරි බැහැරයාම සම්බන්ධ ලේඛන නඩත්තු කරන ලද අතර, මෙම නිවාඩු සම්බන්ධව පරිගණක වාර්තාවෙහි ද සටහන් තබා ඇත. එමෙන්ම, අනුමත ප්‍රමාද වීම් සඳහා දෙනු ලබන සහන, පරිගණක සටහන් පත්‍රිකාවෙහි සටහන් කරන ලදී.

*(ඊ) භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය*

පවිත්‍රතා සේවාව සහ ආරක්ෂක සේවාව සඳහා ආයතන කිහිපයකින් මිල ගණන් කැඳවන ලද අතර, එම සේවාවන් සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ නිපුනි ක්ලීනින් සර්විස් (පුද්) සමාගම හා ගෝල්ඩන්

හාට් (පුද්) ආයතනය සමග ගිවිසුම්වලට එළඹ එකී සේවා කටයුතු භාර දීමට කටයුතු සම්පාදනය කරන ලදී.

***(උ) පුහුණු හා සංවර්ධන කටයුතු පහසුකරලීම***

2012 වර්ෂය සඳහා පහත දැක්වෙන දේශීය පාඨමාලා වෙනුවෙන් පහත දැක්වෙන නිලධාරීන් සහභාගි කරවීම සිදු කරන ලදී.

**<u>දේශීය පුහුණු පාඨමාලා</u>**

| නිලධාරියාගේ නම/තනතුර | පාඨමාලාව |
|---|---|
| සහකාර අධ්‍යක්ෂ - ටී.එම්.ඩබ්.මුදලි මිය | • රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද දෙමළ භාෂා පුහුණු පාඨමාලාව (2012 ජුලි සිට මාස 06ක්) |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) - යූ.පී.විජයශේවා මිය | • මිලෝදා ආයතනය මඟින් පවත්වන ලද වැටුප් පරිගණක මෘදුකාංග පාඨමාලාව (2012.01.13 – 2012.01.21)<br>• රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද දෙමළ භාෂා පුහුණු පාඨමාලාව (2012 ජුලි සිට මාස 06ක්) |
| සහකාර අධ්‍යක්ෂ (පාලන) - එච්.කේ.ඩී.දිල්හානි මිය | • රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද දෙමළ භාෂා පුහුණු පාඨමාලාව (2012 ජුලි සිට මාස 06ක්) |
| සහකාර පර්යේෂණ නිලධාරි - එච්.එච්.ප්‍රියන්ත මයා | • ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පවත්වන ලද උසස් පරිගණක පුහුණු පාඨමාලාව (2012.05.21 – 2012.05.25) |
| සහකාර පර්යේෂණ නිලධාරි - එන්.පී.සී.ප්‍රියංගනී මිය | • ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පවත්වන ලද ව්‍යාපෘති කළමනාකරණ පාඨමාලාව (2012.06.11 – 2012.06.13) |
| සහකාර පර්යේෂණ නිලධාරි - එම්.චන්ද්‍රිකා දමයන්ති මිය | • ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පවත්වන ලද ව්‍යාපෘති කළමනාකරණ පාඨමාලාව (2012.06.11 – 2012.06.13) |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය I - ලක්ෂ්මන් ඉලේපෙරුම මයා | • ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පවත්වන ලද බඳවා ගැනීමේ පරිපාටි සකස් කිරීම පාඨමාලාව (2012.04.30)<br>• ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පවත්වන ලද ප්‍රධාන කළමනාකරණ සහකාර නිලධාරීන් සඳහා පුහුණුව (2012.06.21 – 2012.06.22) |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය I - ඒ.පී.එස්.පී.සමරතුංග මිය | • ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පවත්වන ලද බඳවා ගැනීමේ පරිපාටි සකස් කිරීම පාඨමාලාව (2012.04.30) |

| | |
|---|---|
| | • ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පවත්වන ලද වැටුප් පරිවර්තන සකස් කිරීම පාඨමාලාව (2012.07.11)<br>• ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පවත්වන ලද පෞද්ගලික ලිපිගොනු නඩත්තුව පාඨමාලාව (2012.10.25) |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය III - ඩී.ටී.කේ.පෙරේරා මිය | • ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පවත්වන ලද රජයේ විගණනය පාඨමාලාව (2012.05.08 - 2012.05.09)<br>• රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද දෙමළ භාෂා පුහුණු පාඨමාලාව (2012 ජූලි සිට මාස 06ක්) |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය III - ඩී.කේ.ඩී.කන්නන්ගර මයා | • ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පවත්වන ලද වැටුප් පරිවර්තන සකස් කිරීම පාඨමාලාව (2012.05.09)<br>• රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද දෙමළ භාෂා පුහුණු පාඨමාලාව (2012 ජූලි සිට මාස 06ක්) |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය III - ඩී.පී.ජයසිංහ මෙය | • ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පවත්වන ලද වැටුප් පරිවර්තන සකස් කිරීම පාඨමාලාව (2012.05.09)<br>• ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පවත්වන ලද පෞද්ගලික ලිපිගොනු නඩත්තුව පාඨමාලාව (2012.10.25) |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය III - එම්.ඒ.එෆ්.රිෆ්නා මෙය | • ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පවත්වන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සේවාරම්භක පුහුණු පාඨමාලාව (2012.07.10 – 2012.07.24)<br>• ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පවත්වන ලද මූලික පරිගණක පුහුණු පාඨමාලාව (2012.12.03 – 2012.12.07) |
| කාර්යාල සේවක සේවය III - කේ.එච්.ජී.එරංග නයනජිත් මයා | • ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පවත්වන ලද කාර්යාල සේවක සේවයේ කාර්යාභිවර්ධනය පිළිබඳ පුහුණු පාඨමාලාව (2012.10.08 – 2012.10.10) |

**4.6 මූල්‍ය අංශය**

මුදල් කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබන ව්‍යවස්ථාපිත සහ අනෙකුත් කාර්යයන් නිසි පරිදි පවත්වාගෙන යනු පිණිස මූල්‍ය අංශය මගින් පහසුකම් සලසනු ලැබේ. තවද, මහා භාණ්ඩාගාරය සමග

නිසි සම්බන්ධතාවයක් පවත්වාගෙන යමින් වාර්ෂික මූල්‍ය අවශ්‍යතාවයනට සරිලන පරිදි අරමුදල් සපයා ගැනීමත්, එම අරමුදල් නිසි ලෙස කළමනාකරණය කිරීමත් සිදු කරනු ඇත.

2012 වර්ෂයේදී අයවැය මගින් මුදල් කොමිෂන් සභාව වෙත පුනරාවර්තන වියදම් ලෙස රු.35,250,000.00 ක්ද, ප්‍රාග්ධන වියදම් ලෙස රු.7,400,000.00 ක්ද වෙන් කර තිබුණි.

පුනරාවර්තන වියදම්වල මූල්‍යමය උපයෝගිතාවය 99% ක් වැනි ඉහළ මට්ටමක පැවතිණි. 2012 වර්ෂය වන විට මුදල් කොමිෂන් සභාව යටතේ පැවති සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතිය හා අධ්‍යාපන අංශ සංවර්ධන ව්‍යාපෘතිය අවසන් වී තිබූ අතර, එම ව්‍යාපෘති දෙක සතුව තිබූ යන්ත්‍රෝපකරණ හා ලී බඩු බොහෝ ප්‍රමාණයක් මුදල් කොමිෂන් සභාවට ලබා දෙන ලදී. මේ හේතුව නිසා වර්ෂය තුළ ප්‍රාග්ධන භාණ්ඩ මිළදී ගැනීමේ අවශ්‍යතාවයක් ඇති නොවුණි. එබැවින්, ප්‍රාග්ධන වියදම්වල ඌණ උපයෝජනයක් පෙන්නුම් කර ඇත.

රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 220/2011 ට අනුකූලව නියමිත දිනයන්ට පෙර විසර්ජන ගිණුම් ඇතුළු අනෙකුත් ගිණුම් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සහ විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. 2012 වර්ෂයට අදාලව මුදල් කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රතිපාදන, වියදම හා එහි මූල්‍ය කාර්යසාධනය පහතින් විස්තර කර ඇත.

**<u>මූල්‍ය ප්‍රතිපාදන, වියදම් හා මූල්‍ය ප්‍රගතිය - 2012</u>**

රු.

| විෂය අංකය | විස්තරය | ප්‍රතිපාදන | වියදම | මූල්‍ය කාර්යසාධනය |
|---|---|---|---|---|
| | **පුනරාවර්තන ප්‍රතිපාදන/වියදම** | රු. | | |
| | පුද්ගල පඩිනඩි | 22,256,935 | 20,419,211.02 | 92% |
| | අනෙකුත් පුනරාවර්තන වියදම් | 15,300,000 | 14,320,764.08 | 94% |
| | **එකතුව** | **35,250,000** | **34,739,975.10** | **99%** |
| | **ප්‍රාග්ධන ප්‍රතිපාදන/ වියදම** | | | |
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 600,000 | 44,520.56 | 7% |
| 2003 | රථ වාහන | 1,000,000 | 0.00 | 0% |
| 2102 | ලී බඩු සහ කාර්යාල උපකරණ | 3,000,000 | 60,591.20 | 2% |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,800,000 | 449,700.00 | 25% |
| 2401 | පුහුණු හා ධාරිතා වර්ධනය | 1,000,000 | 253,500.00 | 25% |
| | **එකතුව** | **7,400,000.00** | **808,311.76** | |
| | **මුළු එකතුව** | **42,650,000.00** | **35,548,286.86** | |

**<u>අත්තිකාරම් ගිණුම් කටයුතු</u>**

| විස්තරය | වියදම් උපරිම සීමාව | ලැබීම් උපරිම සීමාව | හර ශේෂයේ උපරිම සීමාව |
|---|---|---|---|
| ප්‍රතිපාදන | 4,000,000.00 | 1,200,000.00 | 20,000,000.00 |
| සත්‍ය (FR 505 (1)) යටතේ ගැලපීම් සිදු කිරීමෙන් පසු | 1,752,321.78 | 1,349,384.00 | 74,514,886.00 |

## 5. පොදු පරිපාලනය

### 5.1 2012 වර්ෂයේ කාර්යමණ්ඩලය

| | |
|---|---|
| සභාපති | ආරියරත්න හේවගේ මයා |
| ලේකම් | ඩබ්.එච්.මුණසිංහ මයා |
| අධ්‍යක්ෂ | පී.සුමනපාල මයා |
| අධ්‍යක්ෂ | ඒ.ටී.එම්.යූ.ඩී.බී.තෙන්නකෝන් මයා |
| අධ්‍යක්ෂ | එස්.බටුවන්තුඩාව මයා (2012.06.05 සිට ස්ථාන මාරු) |
| අධ්‍යක්ෂ | කේ.පී.චන්දිත් මයා |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | ඒ.පී.එල්.ඩී.ඩී.එන්.ප්‍රනාන්දු මිය |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | එම්.එල්.ඒ.චන්ද්‍රදාස මයා |
| සහකාර අධ්‍යක්ෂ | එච්.කේ.ඩී.ඩිල්හානි මිය (2012.10.05සිට ස්ථාන මාරු) |
| සහකාර අධ්‍යක්ෂ | ටී.එම්.ඩබ්.මුදලි මිය (2012.10.01 සිට ස්ථාන මාරු) |
| සංඛ්‍යාලේඛන නිලධාරි | ඒ.කේ.ඩී.සී.එන්.එස්.කේ.කරුණාරත්න මයා |
| සහකාර පර්යේෂණ නිලධාරි | ටී.එම්.සී.කුමාරිහාමි මිය |
| සහකාර පර්යේෂණ නිලධාරි | එන්.පී.සී.ප්‍රියංගනී මිය |
| සහකාර පර්යේෂණ නිලධාරි | පී.ඉන්ද්‍රාදේවි මිය |
| සහකාර පර්යේෂණ නිලධාරි | කේ.එස්.ඩී.නිලන්ති මිය |
| සහකාර පර්යේෂණ නිලධාරි | ඩබ්.ඩබ්.එස්.මානෙල් මිය |
| සහකාර පර්යේෂණ නිලධාරි | එස්.කේ.කේ.ගාමින්ද මයා |
| සහකාර පර්යේෂණ නිලධාරි | ආර්.ආර්.රණසිංහ මිය |
| සහකාර පර්යේෂණ නිලධාරි | එච්.එච්.ප්‍රියන්ත මයා |
| සහකාර පර්යේෂණ නිලධාරි | එම්.සී.දමයන්ති මිය |
| සහකාර පර්යේෂණ නිලධාරි | ඒ.ආර්.මරීනා මෙය |
| සහකාර පර්යේෂණ නිලධාරි | එස්.වයි.දිසානායක මිය |
| සහකාර පර්යේෂණ නිලධාරි | ඩබ්.පී.සී.ආර්.පී.හන්ගම්පෝරුව මිය |
| සහකාර පර්යේෂණ නිලධාරි | අයි.වී.එල්.අයි.ලිලන්ති මිය |
| සහකාර පර්යේෂණ නිලධාරි | එස්.වීරතුංග මිය |
| සහකාර පර්යේෂණ නිලධාරි | කේ.ඩී.පී.ඩී.සිරිවර්ධන මිය |
| සහකාර පර්යේෂණ නිලධාරි | එන්.රත්නායක මයා |
| සහකාර පර්යේෂණ නිලධාරි | ඩබ්.පී.ඒ.විජයසූරිය මයා |
| සහකාර පර්යේෂණ නිලධාරි | එම්.බී.එම්.ඒ.එච්.බණ්ඩාර මයා |
| සහකාර පර්යේෂණ නිලධාරි | ඩී.ඩී.ජේ.කුමාරි මිය |
| සහකාර පර්යේෂණ නිලධාරි | එච්.ජී.ඩී.කේ.කරුණාරත්න මිය |
| වැඩසටහන් සහකාර | පී.ඒ.එස්.ප්‍රියදර්ශනී මෙය |

| | |
|---|---|
| වැඩසටහන් සහකාර | ඩබ්.එම්.එන්.ජී.කරුණාරත්න මිය |
| වැඩසටහන් සහකාර | එස්.බී.සමරසේකර මිය |
| වැඩසටහන් සහකාර | ඩබ්.ආර්.එන්.පෙරේරා මිය |
| කළමනාකරණ සහකාර | ඊ.ඒ.එල්.ඉලේපෙරුම මයා |
| කළමනාකරණ සහකාර | පී.ගමගේ මිය |
| කළමනාකරණ සහකාර | ඩී.කේ.ඩි.කන්නන්ගර මයා |
| කළමනාකරණ සහකාර | ඩී.ටී.කේ.පෙරේරා මිය |
| කළමනාකරණ සහකාර | ඩී.පී.ජයසිංහ මෙය |
| කළමනාකරණ සහකාර | එම්.ඒ.ඩී.අයේෂා ප්‍රනාන්දු මෙය |
| කළමනාකරණ සහකාර | එම්.ඒ.එෆ්.රිෆ්නා මෙය |
| රියදුරු (අනියම්) | උපාලි සෙනෙවිරත්න මයා |
| රියදුරු (අනියම්) | එම්.කේ.ආර්.ප්‍රිමාල් මයා |
| රියදුරු (අනියම්) | බී.පී.ජී.ඒ.දයානන්ද මයා |
| කා.සේ.සේ | ටී.ජයමිණි මයා |
| කා.සේ.සේ | කේ.එච්.ජී.එරංග නයනජිත් මයා |
| කා.සේ.සේ (කොන්ත්‍රාත්) | ඒ.ඩබ්.රවීන්ද්‍ර ජගත් කුමාර මයා |
| සභාපතිගේ පෞද්ගලික සහකාර (කොන්ත්‍රාත්) | සී.ඩී.ආටිගල මිය |
| පුහුණුලාභී | ආර්.ඒ.නිශානි මධූකා රණසිංහ මෙය |
| පරිගණක දත්ත ක්‍රියාකරු (පුහුණුලාභී) | ඩී.ඒ.සන්ධ්‍යා චතුරංගනී මෙය |

### 5.2 මුදල් කොමිෂන් සභාවට මාරු කරන ලද නිලධාරීන් - 2012

| | |
|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) | යූ.පී.විජයහේවා මිය |
| පරිපාලන නිලධාරි | ඩබ්.පී.එස්.මංගලිකා මිය |
| කළමනාකරණ සහකාර I | ඒ.පී.එස්.පී.සමරතුංග මිය |

### 5.3 මුදල් කොමිෂන් සභාවෙන් මාරු කරන ලද නිලධාරීන් - 2012

| | |
|---|---|
| අධ්‍යක්ෂ | එස්.බටුවන්තුඩාව මයා |
| සහකාර අධ්‍යක්ෂ | ටී.එම්.ඩබ්.මුදලි මිය |
| සහකාර අධ්‍යක්ෂ | එච්.කේ.ඩී.දිල්හානි මිය |

### 5.4 මුදල් කොමිෂන් සභාවට කරන ලද නව පත්වීම් - 2012

| | |
|---|---|
| රියදුරු | උපාලි සෙනෙවිරත්න මයා |
| රියදුරු | එම්.කේ.ආර්.ප්‍රිමාල් මයා |
| රියදුරු | බී.පී.ජී.ඒ.දයානන්ද මයා |
| රියදුරු | වසන්ත කුමාර මයා |

## 6. මධ්‍යකාලීනව කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා යෝජිත උපායමාර්ග

පළාත් සැලසුම්කරණය හා අයවැය ක්‍රියාවලිය සම්බන්ධයෙන් හඳුන්වාදෙන ලද නව ප්‍රවේශයන්ට සරිලන පරිදි මුදල් කොමිෂන් සභාවේ සියලුම නිලධාරීන්ගේ දැනුම හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් නවතාවයකට පත් කළ යුතුව ඇත. තවද, කාර්යමණ්ඩලයේ ඵලදායීතාවය වැඩිදියුණු කිරීම සඳහා

අභ්‍යන්තරික වශයෙන් ක්‍රියාමාර්ග රැසක් ගැනීමට සිදු වේ. මෙම සියලු ක්‍රියාමාර්ග සැකෙවින් පහත දැක්වේ.

(අ) මුදල් කොමිෂන් සභාවේ නිලධාරීන්ට ප්‍රතිඵල පාදක සැලසුම් ප්‍රවේශය හා ඊට අදාල වන පරිදි අයවැයකරණය පිළිබඳව අවශ්‍ය විදේශීය හා දේශීය පුහුණුව ලබාදීම. පළාත් මගින් ඉදිරිපත් කරනු ලබන සියලුම වාර්ෂික සංවර්ධන සැලසුම් මුදල් කොමිෂන් සභාව මගින් අනුමත කළ යුතුව ඇති හෙයින්, නිලධාරීන්ගේ තාක්ෂණික දැනුම වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය වේ. තවද, රජයේ සංවර්ධන ප්‍රතිපත්ති, ඒවායේ ප්‍රමුඛතා හා චක්‍රලේඛ ආදිය පිළිබඳව ද නිරන්තරව දැනුවත් වීම අවශ්‍ය කෙරේ.

(ආ) පළාත් හා මුදල් කොමිෂන් සභාව අතර සිදු වන තාක්ෂණික ක්‍රියාකාරකම්වලදී පරිගණක තාක්ෂණය අත්‍යවශ්‍ය වන හෙයින් නව පැකේජයන් හා විද්‍යුත් තැපැල භාවිතා කිරීම පිළිබඳ නිලධාරින්ට මනා පුහුණුවක් ලබාදීම අවශ්‍ය කෙරේ. මෙහිදී, විශේෂයෙන් තොරතුරු තාක්ෂණ ආයතනය, විශ්ව විද්‍යාල හා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සමග සමීප සම්බන්ධතාවයකින් කටයුතු කිරීම අවශ්‍ය කෙරේ.

(ඇ) මුදල් කොමිෂන් සභාව විදේශාධාර ආයතන, උතුරු හා නැගෙනහිර පළාත් සභා සහ විදේශ පුහුණු ආයතන සමග සමීප සම්බන්ධතාවයකින් ක්‍රියාකරන හෙයින් හා පරිගණක භාවිතය අත්‍යවශ්‍ය හෙයින් ඉංග්‍රීසි භාෂාව පිළිබඳව නිලධාරීන්ට මනා පුහුණුවක් ලබාදීම අපේක්ෂා කෙරේ. මෙහිදී, ලිවීම, කියවීම හා අවබෝධය පිළිබඳව අවධානය යොමු කළ යුතු වේ. රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව දෙමළ භාෂාව පිළිබඳව ද නිලධාරීන්ට කිසියම් දැනුමක් ලබාදීම අත්‍යවශ්‍ය වේ.

(ඈ) කාර්යාල කළමනාකරණය හා ඊට සම්බන්ධ ක්‍රියාමාර්ගවල අඩුලුහුඩුකම් දක්නට ලැබෙන හෙයින් නව කළමනාකරණ විධි හා භාවිතයන් පිළිබඳව නිලධාරීන් දැනුවත් කළ යුතු වේ. මෙහිදී, ශ්‍රී ලංකා පරිපාලන සංවර්ධන ආයතනය සමඟ සමීප සම්බන්ධතාවයකින් ක්‍රියා කිරීම අවශ්‍ය කෙරේ.

(ඉ) ඵලදායිතා වර්ධනය සඳහා ද ක්‍රියාමාර්ග ගත යුතු අතර, මෙහිලා බාහිර ප්‍රවීණ දේශකයින්ගේ සහාය ලබාගැනීමට අපේක්ෂා කෙරේ. මෙහිදී, කණ්ඩායම් හැඟීම, පිරිස් කළමනාකරණය, ආචාරධර්ම සහ කාර්යාල පරිශ්‍රය හා අවට නිසි පරිදි පවත්වා ගැනීම යන කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

## 7. විගණන වාර්තාව

මුදල් කොමිෂන් සභාවේ ගිණුම් හා පොත්පත් විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් නිරන්තර අධීක්ෂණයට ලක් කෙරේ. 2012 වර්ෂයේදී විගණන වාර්තාවට පිළිතුරු සැපයීම සිදු කරන ලදී.

**<u>විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දී ඇති අඩුපාඩු සහ ඒවා නිවැරදි කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග</u>**

| පෙන්වා දී ඇති අඩුපාඩු | නිවැරදි කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|
| 2013 වර්ෂයට අදාල සංයුක්ත සැලැස්ම සකස් නොකිරීම. | අංක PFD/RED/01/04/2014/01 දරන 2014.02.17 දිනැති මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතාවය පැන නොනගී. |
| වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තු සභාගත නොකිරීම. | 2011 වර්ෂයට අදාල වාර්ෂික කාර්යසාධන වාර්තාව මේ වන විට විගණකාධිපතිටද පිටපතක් සහිතව පාර්ලිමේන්තුව වෙත යවා ඇත. |
| ප්‍රසම්පාදන සැලැස්ම හා අභ්‍යන්තර විගණනය | චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂය තුළ විශාල ප්‍රසම්පාදන කටයුතු සිදු නොවූ බැවින්, ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතාවය පැන නොනගී. එමෙන්ම, ඉතා කුඩා ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන බැවින්, අභ්‍යන්තර විගණන ඒකකයක් දැනට ස්ථාපිත කර නැත. |
| ප්‍රතිපාදන ඌණ උපයෝජනය | මේ වන විට අයවැයෙන් වෙන් වන මුදල් ප්‍රතිපාදනය ඌණ උපයෝජනයකින් තොරව වැය කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත. |
| හිඟ ණය ශේෂය හා සී සී 10 ලේඛනය | ස්ථාන මාරුවීම්වලට අදාල හිඟ ණය ශේෂය මේ වන විට අය වී ඇති අතර, සේවය අතහැරයාම්වලට අදාල හිඟ ශේෂය අයකර ගැනීමට නීති මගින් කටයුතු කරන ලෙසට ආයතන අංශයට දැනුම් දී ඇත. සී සී 10 ලේඛනය ක්‍රමවත් කොට ඇත. |
| ජංගම නොවන වත්කම් | සංකේතාංක යොදා ඉදිරි ගිණුම්වලදී නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත. |
| නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම් | 2013 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පදනම් කරගෙන මෙම වත්කම් අපහරණය කොට තොග පොත්වලින් ඉවත් කර ඇත. |
| නීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම | අදාල ආපදා ණය රු.250,000/- සීමාව ඉක්මවා ගෙවා ඇති මුදල් නැවත අය කර ඇත. |

*ඇමුණුම 1*

## වෙන් කිරීම් - 2013

## පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන

*රු.මි.*

| අනු අංකය | ආයතනය/ අංශය | බස්නාහිර | මධ්‍යම | දකුණු | උතුරු | නැගෙනහිර | වයඹ | උතුරු මැද | ඌව | සබරගමුව | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | මාර්ග | | | | | | | | | | |
| | 1.1. පළාත් මාර්ග පුනරුත්ථාපනය | 365 | 270 | 240 | 100 | 60 | 250 | 156 | 200 | 215 | 1,856 |
| | 1.2. වතු මාර්ග | 19 | 28 | 24 | - | - | 3 | - | 29 | 19 | 122 |
| 2 | ප්‍රවාහන | 24 | 21 | 21 | 14 | 22 | 11 | 10 | 15 | 16 | 154 |
| 3 | ඉඩම් | 3 | 3 | 3 | 3 | 3 | 3 | 3 | 3 | 3 | 27 |
| 4 | අධ්‍යාපනය | 182 | 177 | 172 | 197 | 173 | 180 | 150 | 190 | 188 | 1,609 |
| 5 | සෞඛ්‍යය (බටහිර වෛද්‍ය) | 165 | 167 | 161 | 197 | 173 | 140 | 120 | 152 | 163 | 1,438 |
| 6 | දේශීය වෛද්‍ය | 20 | 19 | 21 | 26 | 30 | 26 | 28 | 29 | 26 | 225 |
| 7 | ක්‍රීඩා | 14 | 13 | 13 | 14 | 15 | 12 | 12 | 15 | 15 | 123 |
| 8 | පළාත් පාලන | | | | | | | | | | |
| | 8.1. පළාත් පාලන මාර්ග | 142 | 136 | 150 | 50 | 60 | 93 | 75 | 91 | 90 | 887 |
| | 8.2. පළාත් පාලන සේවා | 25 | 19 | 20 | 27 | 20 | 24 | 20 | 18 | 22 | 195 |
| | 8.3. අපද්‍රව්‍ය කළමනාකරණය | 45 | 24 | 25 | 16 | 15 | 15 | 15 | 15 | 15 | 185 |
| 9 | පරිවාස හා ළමාරක්ෂක | 14 | 11 | 17 | 16 | 14 | 18 | 12 | 13 | 14 | 129 |
| 10 | සමාජ සේවා | 10 | 11 | 20 | 16 | 16 | 12 | 10 | 10 | 10 | 115 |
| 11 | නිවාස | 3 | 3 | 3 | 3 | 3 | 3 | 3 | 3 | 3 | 27 |
| 12 | සංස්කෘතික කටයුතු | 3 | 3 | 3 | 4 | 4 | 3 | 3 | 4 | 4 | 31 |
| 13 | කෘෂිකර්මය | 21 | 40 | 42 | 60 | 60 | 48 | 50 | 50 | 45 | 416 |
| 14 | පශු සම්පත් | 17 | 26 | 25 | 30 | 45 | 30 | 25 | 30 | 25 | 253 |
| 15 | මිරිදිය ධීවර | 5 | 6 | 10 | 14 | 15 | 17 | 12 | 10 | 9 | 98 |
| 16 | වාරිමාර්ග | 14 | 21 | 31 | 30 | 40 | 40 | 90 | 34 | 21 | 321 |
| 17 | ග්‍රාමීය යටිතල පහසුකම් | 14 | 18 | 22 | 23 | 16 | 20 | 23 | 22 | 17 | 175 |
| 18 | කුඩා කර්මාන්ත | 10 | 10 | 12 | 9 | 9 | 12 | 9 | 10 | 10 | 91 |
| 19 | ග්‍රාමීය විකල්ප බලශක්ති | 5 | 13 | 10 | 4 | 5 | 7 | 4 | 8 | 8 | 64 |
| 20 | සමුපකාර | 4 | 4 | 4 | 4 | 4 | 4 | 4 | 4 | 4 | 36 |
| 21 | සංචාරක | 19 | 26 | 30 | 26 | 45 | 20 | 24 | 25 | 25 | 240 |
| 22 | තුලිත ප්‍රාදේශීය සංවර්ධනය සඳහා වූ විශේෂ ව්‍යාපෘති | 105 | 125 | 115 | 120 | 123 | 106 | 105 | 129 | 138 | 1,066 |
| 23 | නව්‍යශීලී අරමුදල සඳහා වූ ව්‍යාපෘති | 18 | 35 | 35 | 27 | 30 | 40 | 37 | 35 | 40 | 297 |
| **එකතුව** | | **1,266** | **1,229** | **1,229** | **1,030** | **1,000** | **1,137** | **1,000** | **1,144** | **1,145** | **10,180** |

සටහන: දකුණු පළාත් සමාජ සේවා අංශයට වෙන් කර ඇති රු.මි.20 තුළ රිදියගම නිවර්තන නිවාසය වැඩිදියුණු කිරීම සඳහා වෙන් කළ රු.මි.7ක් ඇතුළත් වේ.